Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

සතිය- 09

විෂය:-නාට්‍ය හා රංග කලාව

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# නාට්‍ය පෙළ රචනය

නාට්‍ය පෙළ යනු නාට්‍යයේ එන අවස්ථා, සිදුවීම්, චරිත සහ රංග විධාන ඇතුළත් සාහිත්‍යමය ලියවිල්ලයි. මෙය නාට්‍ය පිටපත ලෙසින් ද හඳුන්වනු ලැබේ.



නාට්‍ය පෙළක් ලිවීම සඳහා යම්කිසි සිදුවීමක් හෝ කතා ප්‍රවෘත්තියක් පදනම් කර ගනියි. එය යම්කිසි කතාන්දරයකින්, ප්‍රවෘත්තියකින්, තමන් මුහුණ දෙන සිදුවීමකින්, නවකතාවකින්, කෙටිකතාවකින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අප දැන ගන්නා දෙයක් විය හැකිය. නමුත් අප නාට්‍ය පෙළ රචනයේ දී එම කතා ප්‍රවෘත්තියේ මුල,මැද සහ අග ඒ අනු පිළිවෙලින්ම තිබිය යුතුයැයි නියමයක් නැත. රචකයාට අවශ්‍ය කොටස් පමණක් තෝරා ගන්නා අතර එහිදී ඔහුට අවශ්‍ය පරිදි සිද්ධි ගලපා ගනු ලබයි. එසේ නාට්‍යයක සිද්ධි ගලපන පිළිවෙල නාට්‍යයක කතා වස්තුව නම් වේ.

සිද්ධි ගලපන පිළිවෙල නාට්‍යයක කතා වස්තුව නම් වේ.

යම් කතාන්දරයක එන අදහස ඇතැම්විට පෙළ රචනයේ දී වෙනස් වේ.

> උදා.- චුල්ල ධනුද්ධර ජාතකයේ දී කියැවෙන්නේ ස්ත්‍රියගේ චපල බව ය. නමුත් මනමේ නාටකයේ දී පෙන්වා දෙන්නේ අනපේක්ෂිත මොහොතකට මුහුණ දෙන ස්ත්‍රියකගේ හැසිරීමේ ස්වභාවය ය. මනමේ නාට්‍ය පෙළ රචනයේ දී රචකයා ස්ත්‍රිය දෙස මානුෂවාදී බැල්මක් හෙලා ඇත.

**චුල්ල ධනුද්ධර ජාතකයේ එන කතා පුවත**

යටගිය දවස බරණැස් නුවර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කාලයෙහි  එක්තරා බමුණු කුමරෙක් දිසාපාමොක් ඇදුරුතුමන් සමීපයෙහි ශිල්ප උගත්තේය. දිසාපාමොක් ආචාරීහු ශිල්ප නිමවූ කුමරුන්ට චුල්ල ධනුද්ධර යැයි නම් තබා සිය වැඩිමහල් දියණිය ද සරණ පාවා දුන්නෝ ය.

චුල්ල ධනුද්ධර කුමරු ඊතල පන්සියයක් ද සහිත ව පංචායුධයෙන් සැරසී සිය බිරිඳ සමඟ යන අතර තුර වනාන්තරයට පිවිසෙයි. එහිදී තමන් ඉදිරියට එන දරුණු හස්තියෙකු එක් හී තලයකින් විද මරයි.

අනතුරුව අනෙක් වනාන්තරයක දඩමස් පුළුස්සා කන සොරුන් පන්සියයක සමූහයක් දැක මස් ඉල්ලාගෙන ඒමට සිය බිරිඳ ඔවුන් වෙත යවයි. සොරුහු අමු මස් දෙති. කුමරු අමුමස් ආපසු දී පිළිස්සූ මස් ගෙන ඒමට නැවත සිය බිරිඳ පිටත් කරයි. ඉන් කෝපයට පත්වන සොරුන් ධනුද්ධර කුමරු සමග සටනට එළඹේ. කුමරු සොරුන් 499 ක්  තමා ළඟ ඉතිරි ඊතල වලින් විද මරා දමයි. අවසානයේ ඉතිරිවන සොර දෙටුවා සමග ද්වන්ධ සටනක යෙදෙයි. සටන අතර මැද සොර දෙටුවාව යටපත් කරගන්නා කුමරු ඔහු නසා දැමීමට සිය බිරිඳගෙන් කඩුව ඉල්ලා සිටියි. එහිදී ඇය සොරදෙටුවාට කඩුවේ මිටත් කුමරුට කඩු කොපුවත් ලබා දෙන අතර සොර දෙටුවා කුමරුව මරා දමයි. තනිවූ ධනුද්ධර කුමරුගේ බිරිඳ සමග

ගහක් සමීපයට එන සොර දෙටුවා මැයගෙන් තමාටද එබඳුම ඉරණමක් අත්වේයැයි සිතා ඇගේ ආභරණ ද රැගෙන පලා යයි.

මෙම සිදුවීම දකින ශක්‍ර දෙවියන් පංචශිඛ සහ මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවයි. පංචශිඛ උකුසු වෙසක් ද මාතලී මත්ස්‍ය වෙසක් ද තමන් කැනහිල් වෙසක් ද ගෙන ඇය ඉදිරියේ සිදුවීමක් මවයි. කැනහිලා මස් කැටියක් ගෙන ඇය ඉදිරියේ පෙනී සිටියි. එවිට මත්ස්‍යයා දියෙන් ගොඩට පනියි. ඒ දකින කැනහිලා මස් කැටිය අතහැර මත්ස්‍යයා වෙතට දුවයි. ඒ අතර උකුස්සා මස් කැටිය පැහැර ගනියි. මත්ස්‍යයා ද නැවත දියට පනියි. කැනහිලාට මත්ස්‍යයාත් මස්කැටියත් දෙකම අහිමි වෙයි. මෙය බලා සිටින බිසවට සිනහ යයි. කැනහිලා සිනාසීමට හේතු විමසයි. කටින් ගෙන ආ මස් කැටියත් මාළුවාත් දෙදෙනාම අහිමි වූ අයුරු දැක සිනාසුන බව කී කල්හි බිසවටත් සැමියා සහ සොර දෙටු යන දෙදෙනා ම අහිමි වූ බව පෙන්වා නින්දා කර ඊට හේතු දක්වා පතිව්‍රතා ධර්මය ආරක්ෂා කරන ලෙස දන්වා පිටව යයි.




**මනමේ නාට්‍යයේ එන සිදුවීම්**

- බරණැස් පුර රජුගේ පුත් ශිල්ප නිමවා සිය රට බලා යාමට පැමිණීම.
- දිසාපාමොක් ඇදුරුතුමා කුමරුට ධනුද්ධර යන නාමය ලබා දී සිය දියණිය ද සරණපාවා දීම.
- කුමරා සහ කුමරිය වනයේ සිරි නරඹමින් ගමන් කිරීම.
- අතරමගදී වැදි පිරිසක් පැමිණ පිටව යාම.
- ඔවුන්ගෙන් අනතුරක්වේදැයි කුමරිය බියපත්වීම.
- වැදි පිරිස නැවත පැමිණීම සහ වැදිරජු කුමරිය තමා වෙත රඳවා පිටත්වන ලෙස කුමරුට දැන්වීම.
- වැදි රජු සිය පිරිස පිටත් කර මනමේ කුමරු සමග සටනක යෙදීම.
- වැදි රජුව යටපත් කරගන්නා කුමරු ඔහු මරා දැමීමට කුමරියගෙන් කඩුව ඉල්ලීම.
- වැදි රජුට සමාව දෙන ලෙස කුමරිය ඉල්ලා සිටීම.
- එම අවස්ථාවේදී වැදි රජු කඩුව උදුරාගෙන කුමරුන්ව මරා දැමීම.
- අසරණ වූ කුමරිය තමන් ට වැදි රජු කෙරෙහි ප්‍රේමයක් ඇති වී කඩුව ඔහුට දීමට අදහස් කළ බව පැවසීම.
- තමාට ප්‍රේම කළ ස්වාමියාට එවන් අපරාදයක් කිරීමට සිතූ එවැනි ගැහැණියක තමන්ටද එපා යැයි පවසා වැදි රජු පිටව යාම.
- වේදනාවට පත්වන කුමරිය ලය පැලී මිය යාම.

චුල්ල ධනුද්ධර ජාතකයේ කතා පුවත සහ මනමේ නාට්‍යයට යොදාගෙන ඇති සිදුවීම් දෙස බලන විට රචකයා විසින් කරනු ලබන්නේ කතා පුවතක තොරතුරු ඒ ආකාරයෙන් ම යොදා ගැනීම නොව තමාට

අවශ්‍ය සිදුවීම් නාට්‍යානුකූලව පෙළ ගැස්වීම බව ද කතා පුවතේ තොරතුරු තමාට අවශ්‍ය ආකාරයට සකස් කරගන්නා බව ද මෙයින් පැහැදිලි වේ. මෙහිදී රචකයා නාට්‍යයේ සිදුවීම් ස්ථාන දෙකකට සීමා කරගෙන ඇත.

**නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී පහත පියවරයන් අනුගමනය කිරීම වඩාත් සුදුසු වේ.**

- තෝරාගත් කතා පුවත නාට්‍ය රචනයට ගැලපෙන ආකාරයට අවස්ථාවලට වෙන් කර ගැනීම. (ඉහත දැක්වූ චුල්ල ධනුද්ධර ජාතකයේ පරිදි කතා පුවතේ අවස්ථා රැසක් තිබුණ ද පෙළ රචනයේ දී එය අවස්ථා එකකට හෝ දෙකකට සීමා කර ගත යුතුය.)
- මුල,මැද,අග සම්බන්ධය රැකෙන පරිදි අවස්ථා ගළපා ගැනීම.
- නාට්‍යය රචනා කරන ශෛලිය තීරණය කිරීම.
- යම් කිසි ගැටළුවක් නිර්මාණය වන සේ පෙළ රචනා කිරීම.
- සිදුවීම් මගින් ආරම්භක ගැටළුව උච්ඡ අවස්ථාවක් සහ අවසානයක් ගොඩ නැගෙන ලෙස නිර්මාණය කිරීම.
- චරිත, රංග විධාන සහ සංවාද පැහැදිලි වන සේ රචනා කිරීම.

  රචකයාගේ අදහස අධ්‍යක්ෂවරයාට සහ නළු නිළියන්ට පැහැදිලිව තේරුම් ගැනීම සඳහා රංග විධාන පැහැදිලිව ලිවීම අත්‍යාවශ්‍ය ය.

  උදා.- ජයලත් මනෝරත්නයන්ගේ "තලමල පිපිලා" නාට්‍යයේ පහත දෙබසේ එන සාහිත්‍යමය ගුණය සහ රංග විධාන මගින් කෙරෙන පැහැදිලි කිරීම් විමසා බලන්න.

රංබරණා - මටනම් මොකුත් ම හිතාගන්ට බැ ගුණවංශ.

ගුණවංශ - හිතා ගන්ට බැ නෙවී. හිතා ගන්ට පුළුවන් වෙන්ට ඕනෑ. හිත දුර්වල කරගන්ට එපා. (ඔහු වඩාත් රංබරණාට සමීප වේ.) මේක පුංචි රටක්... අපි ආයෙත් කොහේදි හරි මුණ ගැහේවි. මං ගැන කාටවත් කියන්ට ඕනෑ නෑ... දැන් ඉතිං වෙලාව හරි. (පිටතින් අඩි ශබ්දයක් ඇසේ.) ඕ දැනටමත් වෙලාව පරක්කුයි. මම මේ පැත්තෙන් පැනගන්නං. (ගුණවංශ වහා පිටවෙයි.)

රංබරණා - ගුණවංශෙ... ගුණවංශෙ...
(රංබරණා දුර්මුඛ විලාසයෙන් ආපසු හැරෙයි.)

- සංවාද මගින් චරිතයේ වයස, තරාතිරම සහ චරිත ස්වභාවය හෙළි විය යුතු ය.

තෝරා ගත් කතා පුවතින් ප්‍රකාශ වන අදහසට වඩා වෙනත් අදහසක්, අර්ථයක් මතු වන පරිදි කතා පුවත නිර්මාණය කිරීම වඩාත් සාර්ථක රචකයකුගේ ලක්ෂණයකි. මූලික කතා පුවත වෙනස් කරමින් නව අර්ථකථනයත් ඉදිරිපත් කිරීමට පෙළ රචනයේ දී උත්සාහ කළ යුතු ය.

උදා. - මහාවංශයේ එන යසලාලක තිස්ස රජුගේ කතාව ඇසුරෙන් සයිමන් නවගත්තේගම මහතා නිර්මාණය කළ සුබ සහ යස නාට්‍යය ඉතිහාස කතාවකට නව අර්ථකථනයත් දුන් විශිෂ්ට නාට්‍ය පෙළක් සේ හැඳින්විය හැකි ය. ඉතිහාස කතාවට අනුව යස රජු අනුවන, ස්ත්‍රී ලෝලී සහ සුරා ලෝලී රජෙකි. නමුත් නවගත්තේගමයන් සිය නාට්‍ය තුළ දී ජීවිතය පිළිබඳ විනිවිද දකින රජෙකු සහ දේශපාලනයේ ස්වභාවය පිළිබඳව හෙළිකරමින් නව අර්ථකථනයක් ඉදිරිපත් කරයි.

එක් එක් නාට්‍යයේ ස්වභාවය අනුව කතාව ගොඩ නැගෙන ආකාරය වෙනස් වේ. නිදසුනක් ලෙස දිගු නාට්‍යකරුවාට ඇති නිදහස කෙටි නාට්‍යකරුවාට නැත. කෙටි නාට්‍යකරුවා නාට්‍ය රචනයේ සිට ම සංක්ෂිප්ත බව කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එමෙන් ම යතාර්ථවාදී රංග රීතිය, අධි යතාර්ථවාදී රංග රීතිය, අසම්මත රංග රීතිය ආදී වශයෙන් නාට්‍ය නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රංග රීතිය අනුව ද පෙළ රචනයෙහි ස්වභාවය වෙනස් වේ.

ඇගයීම :

1. නාට්‍ය පෙළක් යනු කුමක් ද?
2. නාට්‍ය පෙළක් රචනා කිරීම සඳහා අත්දැකීම් ලබා ගත හැකි ක්‍රම පහක් සඳහන් කරන්න.
3. නාට්‍ය පෙළක් රචනා කිරීම සඳහා සුදුසු අප එදිනෙදා ජීවිතයේ දකින සිදුවීම් පහක් දක්වන්න.
4. ඉහත දක්වන ලද සිදුවීමක් පාදක කරගෙන නව අර්ථකථනයක් මතු වන සේ නාට්‍ය පෙළක් රචනා කරන්න.